# පැෆරල් සංවිධානයෙන් කොමිසමට පැමිණිල්ලක්

■ සාලිය කුමාර ගුණසේකර

පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා නවක කාන්තා ආරක්ෂක නිලධාරිනියන් විසි දෙදෙනෙක් බඳවාගෙන පුහුණුවීම් සඳහා යොදවාගෙන ඇති බව නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (පැෆරල්) විසින් මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි කර ඇත.

මෙම ආරක්ෂක නිලධාරිනියන් ජූනි මස 15 වැනිදා බඳවාගෙන පුහුණුවීම් සඳහා යොදවාගෙන ඇති බවට දුම්රිය ආරක්ෂක නිලධාරීන්ගේ සංගමය විසින් පැෆරල් සංවිධානයට කරන ලද දැනුම්දීමකට අනුව මෙම පැමිණිල්ල ඉදිරිපත්කර තිබේ.

මෙම පත්කිරීම් සිදුකර ඇත්තේ බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවද නොමග යවමින් බවට දුම්රිය ආරක්ෂක නිලධාරීන්ගේ සංගමය විසින් පැෆරල් සංවිධානයට දන්වා ඇත.